# ශ්‍රී ලංකාවට පැමිණි මාධ්‍ය නිදහස පිළිබඳ තොරතුරු සොයාබැලීමේ ජාත්‍යන්තර දූත මණ්ඩලයේ තොරතුරු වාර්තාව

## 'භීතියේ ග්‍රහණයේ පවතින යාපනයේ ජනමාධ්‍ය'
## 2007 අගෝස්තු

ශ්‍රී ලංකා රජයත් දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය (LTTE)ත් අතර ගැටුම් 2006 දී නැවත ආරම්භ වූ අවස්ථාවේ සිට දෙමළ ජනතාව වාසය කරන යාපනය අර්ධද්වීපය මාධ්‍යවේදීන්ට, මානව හිමිකම් ක්‍රියාකාරිකයනට සහ පොදු සිවිල් ජනසමූහයාට බියකරු වාසස්ථානයක් බවට පත්ව තිබේ.

ඝාතන, පැහැරගැනීම්, තර්ජන සහ වාරණයන් හේතු කොටගෙන යාපන, ජනමාධ්‍ය කාර්යයෙහි නියැලෙන්නන්ට ලෝකයේ වඩාත්ම අනතුරුදායක ප්‍රදේශයන්ගෙන් එකක් බවට පත්ව තිබේ. 2006 මැයි මාසයේ සිට එහිදී මාධ්‍යවේදීන් දෙදෙනෙකු ද ඇතුළත්ව මාධ්‍ය සේවකයන් 7 දෙනෙකු අවම වශයෙන් ඝාතනය වී තිබේ. එක් මාධ්‍යවේදියකු අතුරුදහන් වී ඇති අතර අවම වශයෙන් පුවත්පත් අලෙවි කරන ස්ථාන තුනක් ප්‍රහාරයන්ට ලක්ව තිබේ. මාධ්‍යවේදීන් සැලකිය යුතු ගණනක් ප්‍රදේශය හැරගොස් හෝ තම වෘත්තිය අතහැර දමා ගොස් තිබේ. රජය පොරොන්දු වී තිබියදී සහ සැකකරුවන් නම් කර තිබියදීත් මේ කිසිදු සිදුවීමක් පිළිබඳව බලවත් පරීක්ෂණයක් සිදු කෙරී නැත.

ශ්‍රී ලංකාවට පැමිණි මාධ්‍ය නිදහස පිළිබඳ තොරතුරු සොයා බැලීමේ ජාත්‍යන්තර දූත මණ්ඩලයේ කොටස්කරුවන් වූ දේශ සීමා නැති මාධ්‍යවේදියෝ (RSF) සහ ජාත්‍යන්තර මාධ්‍ය සහයෝගීතාවය (IMS) හි නියෝජිතයෝ ජූනි 20 සහ 21 දෙදින තුළ යාපනයේ සංචාරය කළහ. ඔවුහු දෙමළ මාධ්‍යවේදීන්, සන්නද්ධ හමුදා නිලධාරීන්, සිවිල් සමාජ නායකයන් සහ ජාතික මානව හිමිකම් කොමිසමේ (HRC) සාමාජිකයන්ද හමු වූහ. දේශසීමා නැති මාධ්‍යවේදියෝ සංවිධානයත් ජාත්‍යන්තර දූත මණ්ඩලයට අයත් වෙනත් සංවිධානත් විසින් දිනපතා මාධ්‍ය නිදහසට අදාළව කරනු ලැබූ නිරීක්ෂණද මෙම වාර්තාවට පදනම් වේ. ආරක්ෂක හේතූන් නිසා සම්මුඛ සාකච්ඡා පවත්වන ලද බොහෝ මාධ්‍යවේදීන්ගේ සහ සෙසු පුද්ගලයන්ගේ නම් මෙහි ඇතුළත් කිරීමෙන් වැලකී සිටින ලදී.

පසුගිය වසරේ මැයි 2 වැනිදා යාපනය දිස්ත්‍රික්කයේ වඩාත්ම ජනප්‍රිය දිනපතා පුවත්පත වූ 'උදයන්' පුවත්පත් කාර්යාලයට ප්‍රහාරයක් එල්ල වීමෙන් පසු එතැන් සිට ප්‍රදේශයේ මාධ්‍යවේදීන් ජීවත් වූයේත් වැඩකටයුතු කළේත් බියෙනි. එක්තරා පුවත්පතක සංස්කාරක වරයා ඝාතනය කිරීමෙන් පසුව එම පුවත්පත වසා දැමුණු අතර දැනට ප්‍රකාශයට පත්වන්නේ පුවත්පත් තුනක් පමණි. පසුගිය වසරක කාලය තුළ පුවත්පත්වල කාර්ය මණ්ඩල වලින් 90%ක් පමණ සේවයෙන් ඉවත්ව ගියහ. බොහෝ විට තරුණ මාධ්‍යවේදීන් සහ සෙසු කාර්ය මණ්ඩල එසේ තම කටයුතු වලින් ඉවත්වූයේ නිරන්තරයෙන් තම පවුල්වල සාමාජිකයන් වෙතින් ඇතිවන බලපෑම් හේතුවෙනි. පසුගිය වසරේ අගෝස්තු මාසයේ 75 දෙනෙකුගෙන් සමන්විත වූ 'වාලම්පුරි' පුවත්පතේ දිස්ත්‍රික්කයේ වාර්තාකරුවන් ගණන මේ වන විට හතර දෙනෙකු දක්වා අඩු වී තිබේ. 'අපි ප්‍රදේශයේ ප්‍රවෘත්තිවලට වඩා ජාතික සහ ජාත්‍යන්තර ප්‍රවෘත්ති කරා යොමු වී ඇත්තේ අපේ කාර්ය මණ්ඩලයේ බිය නිසා' බව එම පුවත්පතේ සංස්කාරක වරයා කීවේය. 'ප්‍රවෘත්තියකට වඩා අපේ ජීවිතයක් වටින බව අපි දන්නවා' ඔහු වැඩිදුරටත් කීවේය.

පිටපත් 5000කට වඩා වැඩි අලෙවියක් ඇති 'උදයන්' පුවත්පතේ කාර්ය මණ්ඩලය ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදීන් තිදෙනෙකු සහ එක් තරුණ වාර්තාකරුවකු දක්වා පහළ වැටී තිබේ. ඒ අතුරින් එක් මාධ්‍යවේදියෙකු මාස 13කින් කාර්යාලයෙන් පිටතට ගොස් නැත්තේ එසේ පිටතට යන කවර හෝ අවස්ථාවක තමන් මරා දමනු ලැබෙයැයි යන බිය හේතුවෙනි.

දුරකථන ඇමතුම් මගින් හෝ දුරකථන ඔස්සේ ලැබෙන කෙටි පණිවුඩ (Text Message)මගින් මරණීය තර්ජන ලැබීමත් සමඟම ජාතික සහ ජාත්‍යන්තර මාධ්‍ය වාර්තාකරුවෝ ස්ථිර වශයෙන්ම දිස්ත්‍රික්කය අතහැර යාම හෝ සමහර විට දිවයිනෙන්ම බැහැරව යති. තොරතුරු සොයාබැලීමේ දූත මණ්ඩලය යාපනයේ සිටින අවස්ථාවේදීම ජාත්‍යන්තර මාධ්‍ය ආයතනයක පූර්ණ කාලීන වාර්තාකරුවකු වෙත ලැබුණු එවැනි කෙටි පණිවුඩයක් සහ දුරකථන ඇමතුමකින් කියැවුනේ එය ඔහු මරා දැමීමට පෙර කෙරෙන අවසන් දැනුම් දීම බවය. පසුවදාම යාපනයෙන් බැහැරවීමට ඔහු යුහුසුළු විය.

දිවයිනේ නැගෙනහිර පළාතේ එල්.ටී.ටී.ඊ.යට එරෙහිව කළ ප්‍රහාරයන්හි සාර්ථක භාවයත් සමගම ශ්‍රී ලංකා යුද හමුදාව උතුරේද දැවැන්ත ප්‍රහාරයක් දියත් කිරීමට අපේක්ෂා කරයි. නමුත් යාපනයේ මාධ්‍ය පවතින්නේ බියෙනි. රජයත් මහින්ද රාජපක්ෂ ජනාධිපති තුමාත් මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ මාධ්‍ය නිදහස තහවුරු කරන බවට ඉක්මනින් සහතික විය යුතුව තිබේ.

## මාධ්‍යයට එරෙහි හිංසනය ඉහළ යාම

පසුගිය තිස් වසරක පමණ කාලය මුළුල්ලේ පැවැති හිංසාකාරී යුද්ධවලදී දෙමළ මාධ්‍ය ඉලක්කයක් බවට පත්විය. එල්.ටී.ටී.ඊ. සංවිධානය ත්‍රස්තවාදී ක්‍රමවේදයන් භාවිතා කරමින් සටන් කරන්නේ 'දෙමළ ජාතියට' ස්වයං පාලන අයිතිය ලබා දෙන ලෙසට මධ්‍යම ආණ්ඩුව වෙත බල කරමිනි. පසුගිය වසරේ නැවත සටන් ආරම්භ වූ තැන් පටන් ජීවිත 5000ක් පමණ නැති වී ඇති අතර ලක්ෂ ගණනක් ජනතාව අවතැන්ව සිටිති. ප්‍රධාන වශයෙන් ගැටුම් පවතින්නේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල නමුත් එල්.ටී.ටී.ඊ.ය බහුතර සිංහල ජනතාව වෙසෙන ප්‍රදේශවල සහ කොළඹ නගරය වෙතද ප්‍රහාර එල්ල කර තිබේ.

පවතින ගැටුම නිසා අන් සියලු ප්‍රදේශවලට වඩා වැඩියෙන් යාපනය හමුදාකරණය වී තිබේ. ඇඳිරිනීතිය පැනවීම, පීඩාකාරී සැලකීම්, ගමන් බිමන් සීමා කිරීම් සහ පුද්ගලයන්ගේ අනන්‍යතාවය නිරතුරුව පරීක්ෂා කිරීම් ඒ නිසා සිදුවේ. මේ තත්ත්වය මත යාපනය දිස්ත්‍රික්කය දිවයිනේ සෙසු ප්‍රදේශ වලින් හුදකලාව පවතින්නක් බවට පත්ව ඇත. තෝමස් සෞන්දරනායගම් යාපනය අගරදගුරුතුමා ප්‍රකාශ කළේ ජනතාව අතර 'බලාපොරොත්තු විරහිත සහ තමන් අතහැර දමනු ලැබූවන් බවට වූ හැඟීමක්' පැතිර ඇති බවය. 'මාධ්‍යවේදීන්ද මෙම භීතියේ ගොදුරු බවට පත්ව ඇති හෙයින් අපගේ සමාජය අකර්මන්‍ය වෙමින් පවතින්නේ' යැයි එතුමන් වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා එල්.ටී.ටී.ඊ.යට එරෙහිව හමුදා මෙහෙයුම් නැවත ආරම්භ කරනු ලැබීමත් සමගම ප්‍රදේශයේ මානව හිමිකම් වල තියුණු බිඳවැටීමක් ඇති වී තිබේ. එක්තරා නීතිඥයකු ප්‍රකාශ කළේ ''මෙම 'අශෝභන යුද්ධය' විසින් පැහැරගෙන යාම් සහ නීති විරෝධී ඝාතන වලට මඟ පාදා ඇති'' බවය. මානව හිමිකම් කොමිසම විසින් පෙන්වා දුන්නේ 2005 දෙසැම්බර් මාසය සහ 2007 මැයි මාසය අතරතුර යාපනය දිස්ත්‍රික්කයේ අවම වශයෙන් සිවිල් පුද්ගලයන් 835 දෙනෙකු අතුරුදහන්ව ඇති බවත් ඉන් 600ක් පමණ පිළිබඳව කිසිදු තොරතුරක් නොමැති බවත්ය. ප්‍රදේශයේ මාධ්‍ය මෙම පැහැරගෙන යාම් පිළිබඳව වාර්තා කරනු ලැබුවත් මාධ්‍යවේදීන් හට තම කාර්යාල වලට සීමා වී සිටින්නට සිදුවී ඇති නිසා හෝ අතුරුදහන් වීම් වලට සන්නද්ධ හමුදා වල සබඳතාවයන් ඇති නිසා ඒ පිළිබඳව ගවේෂණය කිරීමට නොහැකි තත්ත්වයක් උද්ගත වී තිබේ. හඳුනාගැනීමේ සලකුණු නොමැතිව, ඝාතන කණ්ඩායම් රැගෙන සැරිසරන සුදු වෑන් මෙම 'අශෝභන යුද්ධයේ' සංකේත වැනිය. ඒ මගින් යාපනයේත් කොළඹත් මාධ්‍යවේදීන්ද ඇතුළුව ජනතාවන් භීතියේ ග්‍රහණයෙහි තබාගෙන සිටී.

''යාපනයේ පවතින තත්ත්වය පිළිබඳව ජාතික වශයෙන් හෝ අන්තර්ජාතික වශයෙන් හෙළා දකින්නා වූ කවරකු හට වුවත් ඝාතනය කරනු ලැබීමේ අවදානම ඇතැ''යි ප්‍රදේශයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු දූත මණ්ඩලය වෙත පැවසීය. 'මාධ්‍යවේදී මයිල්වාගනම් නිමලරාජන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රී නඩරාජා රවිරාජ් යන දෙදෙනාගේ ඝාතනයන් පෙන්නුම් කරන්නේ, උතුරේ ජනතාවගේ අවාසනාවන්ත තත්ත්වය පිළිබඳව වාර්තා කරන්නන් නිහඬ කරවීමට සමහරුන් කටයුතු කරන බව' යැයි ඔහු වැඩිදුරටත් පැවසීය. වර්තමාන භීෂණයේ රැහැන් වලින් හමුදාමය මෙහෙයුම් සහ සිවිල් ජනතාවගේ දුෂ්කර තත්ත්වය ආවරණය වී තිබේ. මාධ්‍යවේදීහු; ආරක්ෂක හමුදා, අතුරු හමුදා සහ එල්.ටී.ටී.ඊ.ය අතර ඇතිවන වෙඩි හුවමාරුවීම් වලට මැදි වී සිටින අතර ලිපි, අදහස් දැක්වීම් ඡායාරූප හෝ කාටූන් පවා ප්‍රකාශයට පත්කිරීමට බියෙන් පසුවෙති. ආණ්ඩුවේ කැබිනට් අමාත්‍යවරයකු ද වන ඊ.පී.ඩී.පී. අතුරු හමුදා කණ්ඩායමේ නායක ඩග්ලස් දේවානන්ද මහතා සම්බන්ධයෙන් හාස්‍යය දනවන කාටූනයක් පළකිරීම හේතුවෙන් 2006 මැයි මාසයේදී 'උදයන්' පුවත්පතේ සේවකයන් දෙදෙනෙකුට මැරුම් කන්නට සිදුවිය.

2006 අගෝස්තු මාසයේදී සිදුවූ 'නමදු ඊළනාඩු' (අපගේ ඊළාම් දේශය) නැමැති පුවත්පතේ කළමනාකාර අධ්‍යක්ෂ, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සින්නතම්බි සිවමහාරාජාගේ ඝාතනය මගින් පෙන්නුම් කරන්නේ එල්.ටී.ටී.ඊ.යට විවෘතව උපකාර කරන මාධ්‍ය වල පැවැත්ම පිළිගන්නට මෙම ඝාතක කණ්ඩායම් සූදානම් නැති බවය. ඔහුගේ මරණින් පසුව එම පුවත්පත වසා දමනු

ලැබිණි. දේශපාලකයකු ද වූ 68 හැවිරිදි සිවමහාරාජා ඝාතනය කෙරුණේ යාපනය නගරයේ සිට කිලෝමීටර් 15ක් ඈතින් පිහිටි හමුදා ආරක්‍ෂාව පවතින තෙල්ලිපලෙයි හි ඔහුගේ නිවසෙහිදීය.

'නමදු ඊළනාඩු' පුවත්පත ආරම්භ කෙරුණේ 2002 දී ශ්‍රී ලංකා රජයත් එල්.ටී.ටී.ඊ. සංවිධානයත් අතර සටන් විරාම ගිවිසුම ක්‍රියාත්මක වෙමින් තිබියදීය. එය ප්‍රාදේශීය ප්‍රවෘත්ති ඉලක්ක කරන ලද අතර දෙමළ ජාතිකවාදය වෙත බලවත් ලෙස ආධාර කරන්නක් විය. 2005 දෙසැම්බරයෙහිදී යුද හමුදාව පුවත්පතේ යාපනය කාර්යාලය සෝදිසි කරනු ලැබූ අතර පැය ගණනාවක් පුරා කාර්ය මණ්ඩලයෙන් ප්‍රශ්න කරනු ලැබීය.

2007 අගෝස්තු 02 වැනිදා ජනමාධ්‍ය ශිෂ්‍යයකු වූත්, දෙමළ ශිෂ්‍ය සංගමයට සම්බන්ධ ප්‍රකාශනයක් වූ 'සාලරම්' හි සංස්කාරක වරයා වූත් සහදේවන් නිලක්‍ෂන් ඝාතනය කරනු ලැබිණි. ඔහු ඝාතනය කෙරුණේ රාත්‍රිකාලයේ පනවා තිබූ ඇඳිරි නීති කාලසීමාව අවසන් වන්නට පෙරය. යාපනය නගරයෙන් කිලෝමීටර් තුනක් පමණ ඈතින් පිහිටි ඔහුගේ නිවසට මෝටර් සයිකලයකින් පැමිණි පුද්ගලයෝ දෙදෙනෙක් නිවසට ඇතුළු වී සහදේවන් වෙත වෙඩි කිහිපයක් තැබූහ. මිය යනවිට සහදේවන් යාපනය විශ්ව විද්‍යාලයට අනුබද්ධව පිහිටුවා ඇති මාධ්‍ය සම්පත් පුහුණු මධ්‍යස්ථානයේ (MRTC) ශිෂ්‍යයෙකුව සිටියේය.

## මර්දනය ලක්වූ මාධ්‍ය

2006 මාසයේ සිට 2007 මැයි මාසය දක්වා කාලය තුළ පුවත්පත් මුද්‍රණ කඩදාසි සහ මුද්‍රණ තීන්ත වල ඇතිවූ බරපතල හිඟය හේතුවෙන් යාපනයේ පළවන පුවත්පත් තුනම බලවත් පීඩාවකට ලක්විය. 2006 අගෝස්තුවේ නැවත ගැටුම් ආරම්භ වීමත් සමඟම කොළඹ සිට යාපනය දක්වා එල්.ටී.ටී.ඊ. පාලන ප්‍රදේශය හරහා වැටී ඇති A9 මාර්ගය රජයෙන් වසා දමනු ලැබිණි. ඒ හේතු කොටගෙන යාපනය දිස්ත්‍රික්කය වෙත යැවෙන ආහාර සහ සෙසු සැපයුම් සියල්ල ගුවනින් හෝ මුහුදු මාර්ගයෙන් යැවීමට සිදු වී තිබේ. යුද හමුදාව පළමුවෙන් මුද්‍රණ කඩදාසි සහ තීන්ත යාපනයට අත්‍යවශ්‍ය භාණ්ඩ ලෙස වාර්ග කිරීම ප්‍රතික්ෂේප කළේය. ප්‍රවෘත්ති සඳහා වූ ජනතාවගේ අවශ්‍යතාවය වර්ධනය වෙමින් තිබියේ වී නමුත්, මෙම තත්ත්වයට මුහුණ දීම සඳහා උදයන්, යාල් තිනක්කුරල් සහ වාලම්පුරි යන පුවත්පත්වලට සිදුවූයේ තම පුවත්පත් බෙදාහැරීම් අඩු කිරීමට සහ පුවත්පතේ මුද්‍රණය කරනු ලබන පිටු ගණන පිටු 8 හෝ 12 දක්වා අඩු කිරීමටය. මෙම තත්ත්වය 2006 දෙසැම්බර් සිට 2007 අප්‍රේල් දක්වාම පැවැතියේය. පුවත්පත් ආයතනවලට පුවත්පත් මුද්‍රණයට උචිත මුද්‍රණ කඩදාසි සහ තීන්ත සඳහා ඉතා ඉහළ මිලක් ගෙවන්නට සිදුවූ අතර වාලම්පුරි පුවත්පතට වර්ණ කඩදාසි භාවිතා කරන්නට පවා සිදුවිය.

පුවත්පත්වලින් සහ යාපනයේ රජයේ නිලධාරීන් වෙතින් නැවත නැවතත් ඉල්ලා සිටිනු ලැබුවද යුද හමුදාව සාමාන්‍ය සැපයුම් අත්හිටුවා තිබිණි. කෙසේ නමුත් අවසානයේ ජාත්‍යන්තර බලපෑම මත මැයි පළමුවැනිදා පුවත්පත් මුද්‍රණ කඩදාසි සහ තීන්ත වෙනුවෙන් පනවා තිබූ තහනම ඉවත් කෙරුණු අතර දින කිහිපයක් ඇවෑමෙන් කොළඹ සිට මුහුදු මාර්ගයෙන් එම ද්‍රව්‍ය යාපනයට ළඟා විය. ''ප්‍රවෘත්තිවලට ජනතාවගේ ඇති ඉල්ලුම නිසා අපේ පුවත්පත් අලෙවිය වැඩිවෙමින් තිබුණත් අපට යුදහමුදාවේ අනුකම්පාව මත රැඳී සිටින්නට සිදුවී ඇතැ''යි වාලම්පුරි පුවත්පතේ කළමණාකාර කර්තෘ වරයා කීවේය යාපනයේ මාධ්‍යවේදියකු කෙලින්ම ප්‍රකාශ කළේ හමුදා සැලසුමේ සෑම කොටසක්ම 'යාපනයේ මාධ්‍ය වසාදැමීම' වෙනුවෙන් ක්‍රියාකෙරෙන බවයි.

2006 අගෝස්තු වනවිට හුදකලා භාවයත් වැඩකටයුතු කරගෙනයාම සඳහා වූ වාතාවරණය වඩාත් දුෂ්කරභාවයට පත්වීමත් සතිය පුරා මුළුමනින්ම ඇඳිරිනීතිය පැනවීමත් නිසා මාධ්‍ය නොමැති තත්ත්වයක් උද්ගත විය. සැපයුම් අවධිමත් වූ අතර ජංගම දුරකථන සේවා මුළුමනින්ම කපා හැරිණි. කල්ගත වීමේදී ඇඳිරිනීතිය රාත්‍රියට පමණක් පනවන්නට පටන් ගැණුනු අතර පුවත්පත් මුද්‍රණය නැවත ඇරඹිණ. නමුත් උදයන් පුවත්පත බෙදාහරිනු ලැබූ වාහනයක රියැදුරු හමුදා මුරපොළක් අසලදී රියැදුරු අසුන මතම වෙඩිතබා ඝාතනය කරනු ලැබිණි. A9 මාර්ගය වසා දැමීම ජාතික සහ ප්‍රාදේශීය වශයෙන් නිකුත් කෙරෙන සිංහල-දෙමළ-ඉංග්‍රිසි භාෂා තුනේම පුවත්පත් බෙදාහැරීම කෙරෙහි බලපෑමක් ඇති කරන්නක් විය. පුවත්පත් අලෙවි කරන ස්ථානවලට ලැබෙන සීමාසහිත පුවත්පත් ගණන අලෙවි කරන ලද්දේ අධික මිලකටය. සමහර විට එම මිල කොළඹ මිල මෙන් 50 ගුණයක් පමණ විය. යාපනය නගරයේ තිබූ ඉන්ටර්නෙට් කැෆේ වලින් තුනෙන් දෙකක් පමණ ප්‍රමාණයක් පසුගිය වසර ඇතුළත වසා දැමිණි. එයට හේතු වූයේ ආර්ථික අර්බුදය උග්‍රවීමත් ඇඳිරිනීතිය පැනවීමත් නිසා ප්‍රදේශයේ ජනතාවට අන්තර්ජාලය

ඔස්සේ ප්‍රවෘත්ති ලබා ගැනීම දුෂ්කර වීමයි. මාධ්‍යවේදීන් භාවිතා කරන්නේ ජාත්‍යන්තර ප්‍රජාවගේ ආධාර මත පවත්වාගෙන යනු ලබන MRTC මාධ්‍ය මධ්‍යස්ථාන යයි.

''ටැමිල්නෙට් වෙබ් අඩවියට ප්‍රවේශ වීම ආණ්ඩුව විසින් බාධා කොට වළක්වනු ලැබීමත් සමගම යාපනයේ තත්ත්වයන් පිළිබඳව ප්‍රවෘත්ති ලබා ගැනීමට දෙමළ, සිංහල සහ විදේශීය පුද්ගලයන්ට තිබූ අවස්ථාව වැළකී ගිය'' බව දෙමළ දිනපතා පුවත්පතක් වූ 'සුඩර් ඔලි' හි මාධ්‍යවේදියකු පැවසුවේය. 'එය පැරණි උපායම' බව ඔහු වැඩිදුරටත් කීවේය. අන්තර්ජාල සේවා සැපයුම් ආයතන වලට නිල බලපෑමක් කරමින් මෙම වසරේ ජුනි 15 වැනිදා එම වෙබ් අඩවියට ප්‍රවේශ වීම වළක්වනු ලැබිය.

මෙම ප්‍රවෘත්ති හිඟය පියවනු ලැබුවේ ගුවන්විදුලි මධ්‍යස්ථාන විසිනි. ශ්‍රී ලංකා ගුවන් විදුලිය ඔස්සේ ප්‍රචාරය කෙරෙන බීබීසී ලෝක සේවයේ වැඩසටහන් වඩා ජනප්‍රිය බවට පත්ව තිබේ. කොළඹින් ප්‍රචාරය කෙරෙන FM සේවාවන්ට ජනතාව සවන් දෙනු ලැබුවත් ඒවා මගින් යාපනය පිළිබඳව වූ ප්‍රවෘත්ති ලැබෙන්නේ ඉතා අඩුවෙනි. ඊ.පී.ඩී.පී. අතුරු හමුදාවේ ආධාරකරුවන් විසින් සම්පාදනය කෙරෙන, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ තරංග මාලා ඔස්සේ ප්‍රචාරය වන දෙමළ භාෂාමය ප්‍රවෘත්ති වැඩසටහන් වල අන්තර්ගතය පිළිබඳව බොහෝ දෙමළ මාධ්‍යවේදීන් තුළ ඇත්තේ තදබල විවේචනයකි. පොදු උනන්දුවට අදාළ කරුණු සම්බන්ධයෙන් වුවත් මාධ්‍යවේදීන් වෙත නිල වශයෙන් තොරතුරු ලබාදීම සාමාන්‍යයෙන් ප්‍රතික්ෂේප කෙරෙයි. මෙම වසරේ මාර්තු මාසයේ සිට මානව හිමිකම් කොමිසම, ගවේෂණය කෙරෙන සිද්ධි සම්බන්ධයෙන් ප්‍රවෘත්ති ලබාදීම තම ප්‍රාදේශීය කාර්යාල වලට තහනම් කළේය. මේ සම්බන්ධව තම අදහස් පළකළ යාපනයේ නීතිඥයකු කීවේ ''මානව හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳ වැඩිදුර කරුණු සොයා බැලීමට ප්‍රාදේශීය මාධ්‍යවලට හැකියාව ලැබීමට නම්, එම තොරතුරු අත්‍යවශ්‍ය'' බවයි. ''ආණ්ඩුවේ බලපෑම මත ගන්නා ලද මෙම තීරණය මානව හිමිකම් කොමිසමේ කටයුතු පාලනය කෙරෙන පැරිස් ප්‍රතිපත්තිවලට පටහැනි'' බව ඔහු පැහැදිලි කළේය.

යාපනයේ මාධ්‍යවේදීහු හුදකලා හැඟීමෙන් පෙළෙති ''කොළඹ මාධ්‍ය මේ ප්‍රදේශයට වාර්තාකරුවකු එවන්නේ කලාතුරකින්. ඔවුන් කියන්නේ එය ඉතා වියදම් අධික සහ අනතුරුදායක දෙයක් බවයි. යුද පෙරමුණෙහි ප්‍රවෘත්ති වාර්තා කිරීම සඳහා හමුදාව සමග එන අයට සිවිල් ජනතාව ගැන උනන්දුවක් නැහැ. ඉතින් අපට කිසිම ආරක්ෂාවක් නැහැ'' මෙසේ පැවසුවේ උතුරු ශ්‍රී ලංකා මාධ්‍යවේදීන්ගේ සංවිධානයේ ප්‍රධානියෙකි.

## උදයන් වීරත්වයේ පුවත්පතක්

1985 නොවැම්බරයේ පුවත්පත ආරම්භ කළ දා පටන් මේ දක්වා තම කාර්යය ඉටුකිරීම පිණිස යාපනයේ වඩාත්ම ජනප්‍රිය දෙමළ දිනපතා පුවත්පත වූ උදයන් පුවත්පත අධික මිලක් ගෙවා තිබේ. 1980 ගණන්වල ඉන්දියන් හමුදාව විසින් ඔවුනගේ කාර්යාලවලට බෝම්බ ප්‍රහාර එල්ල කර ඇති අතර 1990 දී ශ්‍රී ලංකා යුද ගුවන් යානා මගින්ද බෝම්බ හෙළා තිබේ. පසුගිය වසර 20 තිස්සේම යාපනයේ සටන් වැද සිටින ඊ.පී.ආර්.එල්.එෆ්. සහ එල්.ටී.ටී.ඊ. ඇතුළු සන්නද්ධ දෙමළ කණ්ඩායම්වල තර්ජනයන්ට එම පුවත්පතේ කාර්ය මණ්ඩල සාමාජිකයන් නොයෙක්වර ලක් වී තිබේ. 1999 දී අතුරු හමුදාවන් විසින් පුවත්පතේ කාර්යාලය තුළට අත් බෝම්බයක් විසිකරනු ලැබීය. යාපනය නගරය මධ්‍යයේ පිහිටා ඇති උදයන් කාර්යාලයේ සේවය කරන කාර්ය මණ්ඩල සාමාජිකයන් හැම විටම සිටින්නේ සෝදිසියෙනි. එක් මාධ්‍යවේදියෙක් නොකඩවා පැය 24ම කාර්යාලයේ සිටියි. පනවනු ලැබූ සීමාවන් හේතුවෙන් 2006 අගෝස්තු මාසය වනවිට පිටපත් 25000ක් ව තිබූ පුවත්පත් අලෙවිය මෙම වසරේ පෙබරවාරියේ සිට පිටපත් 5000 දක්වා අඩු වී තිබේ.

2006 මැයි 02 වැනිදා යුනෙස්කෝවේ මෙහෙයවීමෙන් කොළඹදී ලෝක මාධ්‍ය නිදහස් දිනය සැමරෙද්දී පුවත්පත් කාර්යාලය වෙත කඩා වැදුණු පුද්ගලයෝ පස්දෙනෙක් එහි ප්‍රධාන වාර්තාකරු ආර් කුගනාදන් මහතා හමුවීමට අවශ්‍ය බව පැවසූහ. ඔවුනට කුගනාදන් මහතා සොයා ගැනීමට නොහැකි වූ නිසා එහි සේවකයන්ටත් උපකරණවලටත් වෙඩි පහර එල්ල කළහ. එම වෙඩි පහර වැදී අලෙවි කළමනාකාර සුරේෂ් කුමාර් මහතාත් (35) රංජිත් කුමාර් මහතාත් (28) මිය ගියහ. තවත් සේවකයන් දෙදෙනෙකු හට තුවාල සිදුවූ අතර පරිගණක කිහිපයක් විනාශයට පත්විය. මෙම ප්‍රහාරය සම්බන්ධ පරීක්ෂණවලදී පුවත්පතේ කළමනාකරණය විසින් සැක කටයුතු ඊ.පී.ඩී.පී. හිතවාදී පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් පොලිසිය වෙත ලබා දුන්නද ඒ සම්බන්ධයෙන් චූදිත කිසිවෙක් අධිකරණය වෙත ඉදිරිපත් නොකෙරිණි.

පසුගිය වසරේ අගෝස්තු 15 වැනිදා හමුදා මුරපොළක් අසලදී පුවත්පත් බෙදාහැරීමේ නියුතුව සිටි රියැදුරෙකු රියැදුරු අසුන මත දීම වෙඩිතබා ඝාතනය කෙරිණි. දින තුනකට පසුව පුවත්පතේ ප්‍රධාන ගබඩාව ගිනිතබා විනාශ කරනු ලැබීය. ඊට යාබදව තිබූ බෙදාහැරීමේ අංශයටද හානි සිදුවිය. සැප්තැම්බර් 7 වැනිදා ඇඳිරි නීතිය පනවා තිබූ කාල වේලාවකදී පුවත්පත් කාර්යාලයේ ආරක්ෂක නිලධාරීන් දෙදෙනෙකුහට සන්නද්ධ පුද්ගලයන් පිරිසක් විසින් තර්ජනය කරන ලද අතර යාපනය ශිෂ්‍යන්ගේ වර්ජනයක් කල් දමන ලෙස ඉල්ලමින් පත්‍රිකාවක් මුද්‍රණය කරදෙන ලෙස නියෝග කරනු ලැබීය. එම නියෝගය කඩකළ හොත් තමන් ආපසු පැමිණීමට ඉඩ ඇතැයි ආයුධයක් අතැතිව සිටි එක් පුද්ගලයකු අනතුරු හැඟවීය. දින තුනකට පසුව සන්නද්ධ පුද්ගලයන් තිදෙනෙකු පුවත්පත් කාර්යාලයට ඇතුළු වූයේ ගොඩනැගිල්ල වටා ඉදිකර ඇති තාප්පයෙන් පනිමිනි. ඒ අවස්ථාවේ කාර්යාලය ඉදිරිපස මුර සේවාවෙහි යෙදී සිටි පොලිස් භටයෝ එම සන්නද්ධ පුද්ගලයන් රඳවා තබාගත්තද පසුව යන්නට ඉඩ දුන්හ.

අප්‍රේල් 29 වැනිදා යාපනය නගරයේ පුවත්පත් කාර්යාලය අසලදී පාපැදියකින් ගමන් කරමින් සිටි උදයන් පුවත්පතේ වාර්තාකරුවකු වූ සෙල්වරාජා රජිවර්මන් මෝටර් සයිකලයකින් පැමිණි තුවක්කු කරුවකුගේ ප්‍රහාරයට ලක්ව මියගියේය. ඝාතනයට ලක්වන අවස්ථාව වන විට 24 වැනි වියේ පසුවූ රජිවර්මන් මාස 6ක පමණ කාලයක් තිස්සේ පුවත්පතට අපරාධ වාර්තාකරණයෙහි යෙදුනු වාර්තාකරුවකු විය. ඔහු අතුරුදහන් වීම් පිළිබඳව ගවේෂණයන් සඳහා පොලිස් ස්ථාන වලට සහ රෝහල්වලට යාමට පුරුදු වී සිටියේය. ඔහු යාපනය විශ්ව විද්‍යාලයේ පැවැති මාධ්‍යවේදය පිළිබඳව සවස පන්තිවලටද සහභාගි වූවෙකි. 'උදයන්' පුවත්පතට සම්බන්ධ වන්නට පෙර ඔහු 'නමදු ඊළනාඩු' පුවත්පතේ සේවය කළේය. එම පුවත්පතේ කළමනාකාර අධ්‍යක්ෂවරයා 2006 අගෝස්තු මාසයේදී ඝාතනය කෙරිණි. රජිවර්මන්ගේ ඝාතනය සම්බන්ධයෙන් කෙටි පරීක්ෂණයක් පවත්වනු ලැබුවද එහි ප්‍රතිඵලයක් නොවීය. නමුත් දේශසීමා නොමැති මාධ්‍යවේදියෝ සංවිධානය වෙත සමහර පුද්ගලයන් ප්‍රකාශ කළේ මෙම ඝාතනයට ඊ.පී.ඩී.පී.ය වගකිවයුතු විය හැකි බවය.

ප්‍රහාරයන්ට ලක් වූවද කුඩා කාර්යමණ්ඩලයක් 'උදයන්' පුවත්පත නොකඩවා ප්‍රකාශයට පත්කරයි. ''අපට මාධ්‍යවේදීන් 20 දෙනෙකු ඇතුළත් ව සේවකයන් 120ක ප්‍රමාණයක් 2006 අප්‍රේල් මාසය දක්වා සිටියා. නමුත් දැන් ඒ ගණන 58 දෙනෙකු දක්වා අඩුවෙලා. ඒ අතර සිටින මාධ්‍යවේදීන් ගණන 4යි. මේ සියලු දෙනාම සටන් කරන්නේ තම බියට එරෙහිවයි.'' මෙසේ කීවේ උදයන් පුවත්පතේ යාපනය කාර්යාලයේ සංස්කාරක එම්.වී. කාණමයිල්නාදන් මහතායි. ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේ තමන් ඇතුළු සේවය කරන මාධ්‍යවේදීන් සිව් දෙනාට අතුරු හමුදා වලින් මරණීය තර්ජන එල්ලවී ඇති බවයි. ''පොලිස් ආරක්ෂාව තිබුණත් 2006 මැයි මාසයේ ප්‍රහාරයෙන් පසුව අපි හැම දෙනාම දන්නා කරුණක් නම් අතුරු හමුදාවලට ඔවුනට අවශ්‍ය ඕනෑම විටෙක පහර දීමට හැකි බවයි. අපි සියලු දෙනාම භීෂණයේ ගොදුරු බවට පත්ව සිටින්නේ'' යැයි ප්‍රකාශ කළේ කාණමයිල්නාදන් මහතාගේ නියෝජ්‍ය සංස්කාරක වරයෙකි.

කොළඹින් ප්‍රකාශයට පත් කෙරෙන උදයන් සහෝදර පුවත්පත වූ 'සුඩර්ඔලි' පුවත්පතද නිරන්තරයෙන් ඉලක්ක වන්නකි. තොරතුරු සොයා බැලීමේ දූත කණ්ඩායම දිවයිනේ සිටියදීම ඝාතක කණ්ඩායම් භාවිතා කරන සුදු වෑන් රථයකින් 'සුඩර් ඔලි' පුවත්පතේ සංස්කාරක නඩේස පිල්ලෙයි විද්‍යාදරන් මහතා ලුහුබැඳ තිබේ. 'සුඩර් ඔලි' කාර්යාලය වෙත ද 2005 වසරේදී දෙවතාවක්ම අත් බෝම්බ ප්‍රහාර එල්ල වී ඇත.

## හමුදාව සහ දෙමළ මාධ්‍ය අතර ගැටුම

යාපනයේ සෑම ස්ථානයකම හමුදා කඳවුරු ද හමුදාවද විසිරී සිටිති. හමුදාව විසින් පාලනය කරනු ලබන සිවිල් ජනතාවට ප්‍රවේශවීම වළක්වනු ලැබ ඇති ප්‍රදේශ නගරයට යාබදව තිබේ. සියයට 99ක්ම සිංහලයන් වන 40000ක පමණ භට පිරිසක් මේ වනවිට එහි ස්ථානගතව සිටින අතර නගරයට ඇතුළු වීමට සහ නගරයෙන් පිටවීමට ඔබට හමුදාවේ අවසර ලබා ගැනීමට සිදුවේ. යුද හමුදාව සහ එල්.ටී.ටී.ඊ.ය අතර හුවමාරු වන කාල තුවක්කු ප්‍රහාර දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශවලට නිරන්තරයෙන් එල්ල වීම හේතුවෙන් දස දහ ස් ගණන් සිවිල් පුරවැසියන්ට නැවත වරක් තම ගේදොර හැරදමා යන්නට සිදුවී තිබේ.

දෙමළ මාධ්‍යවලට හමුදා මෙහෙයුම් පිළිබඳව වාර්තා කිරීම දුෂ්කරය. සමහර අවස්ථාවලදී හමුදාවල පෙරමුණු කටයුතු වාර්තා කිරීමට කොළඹ සිටින මාධ්‍යවේදීන්හට ආරාධනා කරනු ලැබුවත් ප්‍රාදේශීය මාධ්‍ය ඒ පිළිබඳව දැනුවත් කිරීමට හමුදාව උනන්දුවක් නොදක්වයි. දෙමළ මාධ්‍යවේදීන් විසින් අසනු ලබන ප්‍රශ්න වලට දෙමළ බසින් පිළිතුරු දීමට සමත් ප්‍රකාශකයකු හෝ නිලධාරියකු පත් කර නැත. බුද්ධි අංශ නිලධාරියකු තොරතුරු සොයා බැලීමේ දූත

මණ්ඩලයට ප්‍රකාශ කළේ දිස්ත්‍රික්කය තුළ හෝ වෙනත් කිසිම ස්ථානයක හමුදාවේ ප්‍රකාශකයකු ලෙස කටයුතු කිරීමට කිසිදු දෙමළ පුද්ගලයකු කැමැති වී නැති බවයි. මේ තත්ත්වය විසින් ශක්තිමත් කෙරෙන්නේ මෙම හමුදාවන් තම ප්‍රදේශ බලෙන් අල්ලාගෙන සිටින්නේ යැයි ප්‍රදේශයේ සාමාන්‍ය ජනතාව අතර පවතින, නිරන්තරයෙන් මාධ්‍ය මගින්ද හෙළිවන හැඟීමයි.

කොළඹට පැන ආ දෙමළ මාධ්‍යවේදියකු ප්‍රකාශ කළේ 'හමුදා සොල්දාදුවන් දෙමළ මාධ්‍යවේදීන්ට ගරු නොකරන' බවයි. 'තමන්ට සොල්දාදුවන් සමඟ සන්නිවේදනය කිරීමේ හැකියාවක් නැති බව සහ ප්‍රධාන වශයෙන් සොල්දාදුවන් මාධ්‍යවේදීන් දෙමළ කොටි සංවිධානයට හිතවත් යැයි සලකන' බවත් ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේය. වාලම්පුරි දිනපතා පුවත්පතේ තරුණ මාධ්‍යවේදියකුගේ අදහස වූයේ 'කිසිදු දෙමළ මාධ්‍යවේදියකු කැමරාවක් රැගෙන හෝ තමන් මාධ්‍යවේදියකු ලෙස ඒත්තු ගැන්වෙන වෙනත් ආකාරයකින් බාහිරව පෙනී සිටින්නට තවදුරටත් නිර්භීත නොවන' බවය.

උතුරු ශ්‍රී ලංකා මාධ්‍යවේදීන්ගේ සංගමයේ සභාපතිවරයා ප්‍රකාශ කළේ 'ජනාධිපති රාජපක්ෂ මහතාගේ පවුල බලයට පත් වූදා පටන් යාපනයේ ප්‍රචණ්ඩත්වයත් දෙමළ ජනමාධ්‍යවේදීන් වෙත එල්ල වූ අඛණ්ඩ පීඩනය සහිත එදිරිවාදීත්වයත් බලවත්ව වර්ධනය වූ' බවයි. ඔහු තවදුරටත් කීවේ 'ඔබ යම් ආකාරයක සංවේදී මාතෘකාවක් පිළිබඳව ලියූ කල පසුවදාම ඔබට ප්‍රශ්න වලට මුහුණ දෙන්නට සිදුවන' බවය.

පසුගිය වසර තුළ හමුදා නිලධාරිහු අවම වශයෙන් සිව් වතාවක් දෙමළ මාධ්‍ය ප්‍රධානීන්ට තමන් හමුවන ලෙසට දැනුම් දීම් කළහ. ඔවුනට අවශ්‍ය වූයේ වාරණය කළ යුතු යැයි ඔවුන් සිතන එල්.ටී.ටී.ඊ. නායකයාගේ කථා, ශිෂ්‍ය වර්ජන, පැහැරගෙන යාම් වැනි කරුණු මාධ්‍යවේදීන් විසින් වාර්තා කිරීම වැළැක්වීමය. හමුදාවේ මෙම නියෝග හේතුවෙන් දෙමළ මාධ්‍ය උභතෝකෝටික ප්‍රශ්නයකට ඇද දමනු ලැබිණි. හමුදාවට ප්‍රචාරය වීම අවශ්‍ය නොවූ ප්‍රවෘත්ති ප්‍රචාරය වීම එල්.ටී.ටී.ඊ. යට අවශ්‍යය. එම ප්‍රවෘත්ති දෙමළ ජාතිකවාදයේ ප්‍රකාශනයන් ලෙස එල්.ටී.ටී.ඊ.ය හඳුන්වයි.

පලාලි යුද හමුදා කඳවුරේ අණ දෙන නිලධාරියා වූ ජනරාල් ජී.ඒ. චන්ද්‍රසිරි සැප්තැම්බර් 24 වැනිදා උදයන් පුවත්පතේ නිලධාරියකු කැඳවා නියෝග කළේ ආණ්ඩුවත් හමුදාවත් දුෂ්කර තත්ත්වයට පත්ව සිටින බව පෙනෙන ප්‍රවෘත්ති මුද්‍රණය නොකරන ලෙසය. ''එසේ කිරීම ඔබ ප්‍රතික්ෂේප කරන්නේ නම් පුවත්පත වසා දැමීමට සිදුවනු ඇතැයි'' ඔහු අවවාද කළේය. ඊට අමතරව මෙම කැඳවීම රහසක් ලෙස තබාගන්නා ලෙසත් විශේෂයෙන් ටැමිල්නෙට් වෙබ් අඩවියට දැනගන්නට ඉඩ නොතබන ලෙසත් හමුදා ජනරල් වරයා දැනුම් දුන්නේය. මෙවැනි තර්ජන තිබියදීත් 'උදයන්' පුවත්පත බලධාරීන් පිළිබඳව විවේචනයන් පළකරයි.

ඔක්තෝබර් 11 වැනිදා මාධ්‍ය නිලධාරීන් කැඳවූ 52 වැනි බ්‍රිගේඩයේ අණදෙන නිලධාරි වරයා එල්.ටී.ටී.ඊ. ප්‍රවෘත්ති පළ කිරීම නවත්වන ලෙස ඉල්ලා සිටියේය.

යාපනයේ ස්ථාපිත 512 වැනි කොට්ඨාසයේ යුද හමුදා නිලධාරීහු නොවැම්බර් 6 වැනිදා නගරයේ පුවත්පත්වල සංස්කාරකවරුන් කැඳවා අවවාද කළේ නොවැම්බර් 27 දාට යෙදෙන එල්.ටී.ටී.ඊ. විරු සමරු දිනයේදී එල්.ටී.ටී.ඊ. නායක වේලුපිල්ලේ ප්‍රභාකරන් විසින් නිකුත් කරනු ලබන පණිවුඩය මුද්‍රණය නොකරන ලෙසය. එම අවදානම තිබියදීත් උදයන් පුවත්පත අවසානයේ එම පණිවුඩය මුළුමනින්ම පාහේ පළ කරනු ලැබූ අතර වාලම්පුරි පුවත්පත ඉන් සමහර කොටස් උපුටා ගෙන පළ කළේය.

යාපනය දිස්ත්‍රික්කයේ ඇති වී තිබෙන මානවවාදී අර්බුදය පිළිබඳ සවිස්තර ලෙස වාර්තා කිරීම සම්බන්ධයෙන් හමුදා නිලධාරීන් පුවත්පත්වල සංස්කාරක වරුන් විවේචනය කර ඇති බව වාර්තා වී තිබේ. ප්‍රධාන වශයෙන් හමුදාවේ තහනම නිසා යාපනයට ආහාර සහ ඉන්ධන සැපයුම දුර්වල වී ඇති බව වාර්තා කිරීමෙන් වැළකී සිටින ලෙස හමුදාව විසින් කරන ලද ඉල්ලීම් මාධ්‍යවේදීන් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ තිබේ.

මෙම වසරේ මැයි මාසයේ මුල් භාගයේ පැවැති ශිෂ්‍ය විරෝධතාවයන් වාර්තා නොකරන ලෙස යුද හමුදාව යාපනයේ මාධ්‍ය වෙත බලපෑම් කළේය. ශිෂ්‍යයන්ගේ එම විරෝධතාවය පැවැතියේ ශිෂ්‍යයන් සිව් දෙනෙකු පැහැරගෙන යාමට එරෙහිවය. ජුනි මාසයේදී සොල්දාදුවන් පිරිසක් 'යාල් තිනක්කුරල්' පුවත්පතේ කාර්යාලය සෝදිසි කරන ලද්දේ පෙනෙන සුළු හේතුවක් නොමැතිවය.

2006 දෙසැම්බරයේදී ත්‍රස්ත - විරෝධී නීති පනවනු ලැබීමෙන් පසුව යාපනයේ මාධ්‍ය වල ස්වයං - වාරණ තත්ත්වය වර්ධනය වී තිබේ. කොළඹ පළවන ඉංග්‍රීසි භාෂාමය මාධ්‍ය පවා සිවිල් යුද්ධයේ සමහර අංශ පිළිබඳව සඳහන් නොකරන අතර යාපනයේ මාධ්‍ය හමුදාවේ හෝ එල්.ටී.ටී.ඊ.යේ මෙහෙයුම් පිළිබඳව සවිස්තර වාර්තා පළ නොකිරීමට ප්‍රවේශම් සහගත වී තිබේ.

''යාපනයේ පුවත්පත් දෙමළ ජාතික වාදයේ ආරක්ෂකයන් වන ප්‍රතිවිරෝධී මාධ්‍යයක් යැයි විදේශීය නිරීක්ෂකයකු කියයි''. දෙමළ ජාතිකවාදය බලහත්කාරයෙන් කුඩුපට්ටම් කර දැමීමේ අවශ්‍යතාවය ඇති ආණ්ඩුවේ ගොදුරු බවට අප පත්ව තිබේ. ස්වයං පාලනයට දෙමළ ජනතාවට ඇති අයිතිය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් පුදුම වීමට හේතුවත් මට පෙනෙන්නේ නැහැ' යැයි ප්‍රකාශ කළේ උදයන් පුවත්පතේ නිලධාරියෙකි.

යුද හමුදාව ද පලාලි හමුදා කඳවුරේ ගුවන් විදුලි මධ්‍යස්ථානයක් 'යාල් FM' නමින් පිහිටුවා තිබේ. ඒ මගින් විශේෂයෙන් කෙරෙන්නේ ජනතාව වෙත ඇඳිරි නීති පනවන සහ ඉවත් කරන වේලාවන් දැනුම් දීමයි. ''සමහර ප්‍රායෝගික තොරතුරු ජනතාවට ප්‍රයෝජනවත් වන නමුත් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මගින් විකාශය කෙරෙන ඊ.පී.ඩී.පී. අතුරු හමුදාවේ පැය දෙකේ වැඩසටහන පිළිගන්නට අපට නොහැකි යැයි'' ප්‍රකාශ කළේ උතුරු ශ්‍රී ලංකා මාධ්‍යවේදීන්ගේ සංගමයේ නිලධාරියෙකි.

'ඉදය වීනි' නම් වූ මෙම වැඩසටහන කොළඹ සිට නිෂ්පාදනය කරනු ලබන්නේ ඊ.පී.ඩී.පී.යට පක්ෂපාතී වූ මාධ්‍යවේදීන් පිරිසකි. සැන්දෑ කාලයේදී විකාශය වන මෙම වැඩසටහන පිළිබඳව අදහස් දැක්වූ එක් මාධ්‍යවේදියකු කීවේ 'එය අප හැම දෙනාටම අපහාස කරන සෝර ප්‍රචාරක වැඩසටහනක්' බවය.

## හමුදාවේ පාපී හවුල්කාරීත්වය

ගැටුම් සොයාබැලීමේ ජාත්‍යන්තර කණ්ඩායම (International Crisis Group) ඇතුළු සමහර ස්වාධීන සංවිධාන පවසා ඇති ආකාරයට මාධ්‍ය ඉලක්ක කරගත් ඝාතන කණ්ඩායම් සමන්විත වන්නේ; හමුදා බුද්ධි අංශ වලට මිශ්‍රවූ පිරිස්. සහ ප්‍රධාන වශයෙන් ඊ.පී.ඩී.පී. ය සහ එල්.ටී.ටී.ඊ. යෙන් බිඳී ගිය කරුණා කණ්ඩායමේ අතුරු හමුදාවලට අයත් පුද්ගලයන්ගෙනි. යුද හමුදාව සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කරන මෙම අතුරු හමුදාවන් පසුගිය වසර කිහිපය තුළ මාධ්‍යවේදීන්ගේ කාර්යසාධන තත්ත්වය විනාශ කිරීමෙහිලා ප්‍රධාන වශයෙන් වගකිවයුතුව තිබේ.

බොහෝ ප්‍රහාරයන් සිදුවී ඇත්තේ පොලිසියේ සහ යුද හමුදාවේ මුරපොල බොහොමයක් පවතින ඉහළම ආරක්ෂාව පවතින ප්‍රදේශවලය. සමහර සිදුවීම් සිදුවී ඇත්තේ ඇඳිරි නීතිය ක්‍රියාත්මකව තිබියදීය. එම සිදුවීම් පිළිබඳව පොලිසිය මූලික ස්ථානීය පරීක්ෂණයන් පමණක් පවත්වා ඇති අතර පරීක්ෂණ කටයුතු එපමණකින් නතර වී තිබේ.

මෙම 'අශෝභන යුද්ධය' තුළ යුද හමුදාව ඊ.පී.ඩී.පී.ය වෙත විශේෂයක් ඇතිව දෙමළ අතුරු හමුදාවන්ට සමහර මෙහෙයුම් පවත්වාගෙන යන්නට ඉඩ ලබා දෙනු ලැබේ. 1987 දී පිහිටුවනු ලැබූ ඊ.පී.ඩී.පී. පක්ෂය සහ එහි අතුරු හමුදාව යුද හමුදාවෙන් සහ ආණ්ඩුවෙන් තමනට ලැබෙන රැකවරණය භාවිතා කරති. එහි නායකයා වූ ඩග්ලස් දේවානන්ද මහතා සමාජ සේවා කටයුතු පිළිබඳ ඇමැතිවරයා වන අතර එල්.ටී.ටී.ඊ. යේ ප්‍රධාන ඝාතන ඉලක්කයකි. ඔහු ඝාතනය කිරීමට අවස්ථා ගණනාවකදී උත්සාහ දරනු ලැබිණි.

දේවානන්ද මහතා පවසන්නේ ඔහු එල්.ටී.ටී.ඊ.යේ ඒකාධිපතිත්වයට එරෙහිව දෙමළ ජනතාව ආරක්ෂා කරන බවයි. එහෙත් දශකයකට වැඩි කාලයක් මුළුල්ලේ ඊ.පී.ඩී.පී. ය මානව හිමිකම් උල්ලංඝණය කිරීම් රාශියක් සිදුකර ඇති බවට තොරතුරු තිබේ. මීට පෙර වාර්තාවක දේශ සීමා නොමැති මාධ්‍යවේදියෝ සංවිධානය සඳහන් කර ඇති පරිදි යාපනයේ ඊ.පී.ඩී.පී. සාමාජිකයෝ මාධ්‍යවේදී මයිල්වාගනම් නිමලරාජන් ඝාතනයට සම්බන්ධය. මෑතකදී උදයන් පුවත්පතට එල්ල කෙරුණු ප්‍රහාරය පිටුපසද ඔවුන් සිටිතැයි ප්‍රබල සැකයක් තිබේ.

යාපනයේ හමුදාමය මුර සංචාරවල දෙමළ අතුරු හමුදාවන් නියුක්තව සිටින බව තොරතුරු සොයා බැලීමේ ජාත්‍යන්තර දූත මණ්ඩලය සහතික කර තිබේ. බොහෝ අවස්ථාවල භාෂා පරිවර්තනයෙහි සහ මග පෙන්වීමෙහි යෙදී සිටියද ඔවුහු හමුදා මෙහෙයුම් සහ සිවිල් ජනතාවට එරෙහි හිංසාකාරී කටයුතු වලද නිරත වෙති.

''මාධ්‍යවේදීන් ඝාතනය කිරීම් සම්බන්ධයෙන් කිසිවකු දඬුවම් නොලබන තාක් කල් දෙමළ මාධ්‍ය සහ යුද හමුදාව අතර විශ්වාසයක් ඇති නොවනු ඇති'' බවට යාපනය දිස්ත්‍රික්කයේ දෙමළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු කියා සිටියේය. ''රජයට තමන් කැමැති වන්නේ කුමකට දැයි කිව හැකි වුවත් රජය මෙම ප්‍රහාරයන්ගේ හවුල්කරුවකු බව පැහැදිලි'' යැයි ඔහු වැඩිදුරටත් කීවේය.

## මාධ්‍යවේදියකු අතුරුදහන් වේ

මේ වසරේ පෙබරවාරි 15 දින යාපනය නගරයට උතුරෙන් වූ වඩමරාච්චි හිදී මාධ්‍යවේදී සුබ්‍රමානියම් රාමචන්ද්‍රන් පැහැරගෙන යාමේ සිද්ධියට සොල්දාදුවන් සම්බන්ධ බවට වාර්තා වී තිබේ. 'යාල් තිනක්කුරල්' දිනපතා පුවත්පතෙහි වාර්තාකරුවකු වූ රාමචන්ද්‍රන් යුදහමුදාව සහ ව්‍යාපාරිකයකු එක්ව පවත්වාගෙන ගිය වැලි ජාවාරමක තොරතුරු ගවේෂණාත්මක වාර්තාවක් මගින් ප්‍රකාශයට පත් කළේය. එම වාර්තාවෙහි ජාවාරමට සම්බන්ධ වාහනවල ලියාපදිංචි අංක සහ ව්‍යාපාරිකයා සහ සමහර හමුදා නිලධාරීන් අතර ඇති සම්බන්ධතා පිළිබඳවද තොරතුරු ඇතුළත් විය. මෙම වාර්තා පළවීමත් සමගම අධිකරණයේ විනිශ්චයකාරවරයකු ජාවාරමට සම්බන්ධ වාහන අත්අඩංගුවට ගැනීම සඳහා නියෝග කළේය. එල්.ටී.ටී.ඊ. ආධාරකරුවෝ ජාවාරමට භාවිතා කළ තවත් වාහනයක් ගිනි තබා විනාශ කළහ.

යුද හමුදාව සමඟ රාමචන්ද්‍රන්ගේ පැවැති යහපත් සබඳතා හේතුවෙන් එල්.ටී.ටී.ඊ.ය ඔහු වෙත තර්ජනය කර තිබිණි. 2006 නොවැම්බරයේදී එල්.ටී.ටී.ඊ. නායක වේලුපිල්ලේ ප්‍රභාකරන් වෙත ගෞරවය පළ කිරීමේ රැළියක ඡායාරූප ගැනීම සම්බන්ධයෙන් එල්.ටී.ටී.ඊ. බුද්ධි අංශය විසින් ඔහු පිළිබඳව ගවේෂණයක් කරන්නට ඇතැයි කියැවේ. ඔහුගේ මිතුරන් පවසන්නේ ඔහු පැහැරගෙන ගිය කාලය වනවිට ඔහුට එල්.ටී.ටී.ඊ. තර්ජනයක් නොතිබූ බවයි.

දූත මණ්ඩලය විසින් එක්රැස් කරගත් තොරතුරු වලට අනුකූලව රාමචන්ද්‍රන් පෙබරවාරි 15 දා අපරභාගයෙහි කරවෙට්ටි හි ඔහු විසින් පවත්වාගෙන ගිය පාසලෙන් තම මිතුරකු සමඟ පිටත්ව ගොස් ඇත. කිලාලි මන්සන්ධි හමුදා මුරපොලෙහිදී ඒ දෙදෙනා ප්‍රශ්න කිරීම සඳහා නවත්වා ගනු ලැබූ අතර ඔහුගේ මිතුරා පිටත්කර යවා රාමචන්ද්‍රන් නවත්වා ගෙන තිබේ. ඇසින් දුටු සාක්ෂිකරුවන්ට අනුව පැයකට පමණ පසුව හමුදා බුද්ධි අංශ නිලධාරියකු, ඊ.පී.ඩී.පී. ක්‍රියාකාරිකයන් දෙදෙනෙකු සහ හමුදා ඔත්තුකරුවකු වාහනයක නැගී එහි පැමිණ තිබේ. විනාඩි කිහිපයකට පසුව එම පිරිස රාමචන්ද්‍රන්ද රැගෙන එම ස්ථානයෙන් පිටත්ව ගොස් තිබේ. එතැන් සිට රාමචන්ද්‍රන් පිළිබඳව කිසිදු තොරතුරක් ඔහුගේ පවුලේ උදවියට ලැබී නැත.

යාපනයේ මානව හිමිකම් කොමිසන් කාර්යාලය මෙම සිද්ධිය පිළිබඳ කටයුතු කළ අතර පසුව එය කොළඹ කාර්යාලය වෙත යවන ලදි. මේ පිළිබඳව නියමිත පරිදි යාපනය දිස්ත්‍රික් අණදෙන නිලධාරියා ද ඇතුළත්ව යුද හමුදාව වෙත දැනුම් දී තිබේ. නමුත් 'මදියාපු රෙමඩියස්' නම් නීතිඥයාගේ අදහස 'මෙවැනි කරුණු වලට තමන්ගේ ඇති සම්බන්ධය ප්‍රතික්ෂේප කර තිබෙන හමුදාවට විරුද්ධ වන්නට හැම දෙනාම බිය' බවයි.

## එල්.ටී.ටී.ඊ. තර්ජන

එල්.ටී.ටී.ඊ. යේ පීඩනය වඩා තීක්ෂණ සහ ප්‍රතිඵලදායී එකකි. බෙදුම්වාදී සංවිධානය විවේචන බාරගන්නේ ඉතා නරක ආකාරයටය. ඔවුහු මාධ්‍යද ඇතුළුව දෙමළ සමාජයෙහි තමනට විරුද්ධ හඬට එරෙහිව ඉතා ඉක්මනින් ක්‍රියා කරති. මේ නිසා ඊ.පී.ඩී.පී. යට හිතවාදී මාධ්‍යවේදීන් බොහෝවිට ඔවුනගේ ඉලක්ක බවට පත්වේ. පසුගිය වසර හතරක කාලය තුළ එවැනි මාධ්‍යවේදීන් දෙදෙනෙකු ඝාතනය කෙරිණි.

'එල්.ටී.ටී.ඊ. යේ ප්‍රතික්‍රියාවන් අපගේ කාර්ය මණ්ඩලයට බෙහෙවින් හානිකර විය හැකි නිසා අපි හරි ප්‍රවේශමෙනුයි කටයුතු කරන්නේ. එල්.ටී.ටී.ඊ.ය ගැන සහ යුද හමුදාව ගැන සඳහන් කරද්දි යොදන සෑම වචනයක් ගැනම සැලකිලිමත් විය යුතුයි. අපි සාමාන්‍යයෙන් කොටින් 'ත්‍රස්තවාදීන්' ලෙස කිසිවිටෙක හඳුන්වන්නේ නැහැ' යැයි දෙමළ සංස්කාරක වරයකු කීවේය.

එල්.ටී.ටී.ඊ.ය විසින් ඍජු ලෙසම කරන ලද කිසිදු ප්‍රහාරයක් පිළිබඳව කිසිවෙකු තොරතුරු සොයා බැලීමේ දූත මණ්ඩලය වෙත කිසිවක් ප්‍රකාශ කළේ නැත. නමුත් වාර්තා කළ යුතු දේ මේ යැයි කොටින් විසින් දෙනු ලැබූ 'උපදෙස්' ප්‍රතික්ෂේප කිරීමට දුෂ්කර වූ නිසා සමහර මාධ්‍යවේදින් නගරයෙන් පළාගොස් ඇති බව වාර්තා විය. එල්.ටී.ටී.ඊ. බුද්ධි අංශ නියෝජිතයෝ ඉතා ක්‍රියාශීලී මෙන්ම හොඳින් තොරතුරු වලින් සමන්විතද වේ. ඔවුහු බොහෝවිට තොරතුරු විමසීමට හෝ තොරතුරු ලබාදීමට දෙමළ මාධ්‍යවේදීන් තමන් වෙත කැඳවති.

තවමත් යාපනය දිස්ත්‍රික්කය තුළදී 'කොටිහඬ' ගුවන් විදුලි සේවයට සවන්දීමට පුළුවන. සමාජයේ කැපී පෙනෙන පුද්ගලයන් සහ මාධ්‍යවේදීන් ද ඇතුළුව සමහර අය ප්‍රකාශ කළේ එම ගුවන්විදුලිය 'ප්‍රචාරක කටයුතු' කරන නිසා මේ දිනවල එයට සවන්දෙන පිරිස අඩුවී ඇති බවය. යාපනය අගරදගුරු තුමා කීවේ 'ජනතාව එයට සවන් දෙන්නට බිය' බවයි.

## නිහඬතාව, පිටමං වීම හෝ මරණය

තවමත් යාපනයේ පවතින භීෂණය විසින් එහි බොහෝ මාධ්‍යවේදීන් තම වෘත්තියෙන් බැහැර කරනු ලැබ තිබේ. සෙස්සන් තම කාර්යයන් ඉතා ප්‍රවේශමෙන් කරගෙන යන අතර ජාතික සහ

ජාත්‍යන්තර මාධ්‍ය වෙත තොරතුරු සපයන්නෝ තමන් එසේ තොරතුරු සපයන්නන් ලෙස හැඳින්වීම ප්‍රතික්ෂේප කරති. ඔවුන් නැවත නැවත මතක් කරන්නේ බී.බී.සී. ලෝක සේවයේ සිංහල වැඩසටහන් වලට තොරතුරු සම්පාදනය කළ, එමෙන්ම විදේශිය මාධ්‍යවේදීන් යාපනයට පැමිණි අවස්ථාවලදී ඔවුන් වෙත සත්කාර සේවයේ නියැලි මයිල්වාගනම් හට අත්වූ ඉරණමයි. එම මාධ්‍යවේදියා 2000 ඔක්තෝබර් මාසයේ එක්තරා රාත්‍රියක ඔහුගේම නිවසේදී ඊ.පී.ඩී.පී. ය විසින් ඝාතනය කරනු ලැබිණි.

යාපනයේ මාධ්‍යවේදීන් සෑහෙන පිරිසක් අතුරු හමුදාවල හෝ ආරක්ෂක හමුදාවල තර්ජනයන් හේතුවෙන් මේ වනවිට දිස්ත්‍රික්කය හැරගොස් තිබේ. ඉන් සමහරුන් දිවයිනෙන් ද බැහැරව ගොස් සිටිති. එල්.ටී.ටී.ඊ.ය විසින් කරනු ලබන හිංසනයන්ද මාධ්‍යවේදීන් මෙලෙස ප්‍රදේශය අතහැරයාම සඳහා හේතු වී තිබේ. ශ්‍රී ලංකාවේ මාධ්‍යවේදීහු ස්විට්සර්ලන්තයේ, ප්‍රංශයේ, බ්‍රිතාන්‍යයේ, ඉන්දියාවේ සහ එක්සත් ජනපදයේ රැකවරණ ලබා සිටිති.

තොරතුරු සොයා බැලීමේ ජාත්‍යන්තර දූත මණ්ඩලය යාපනයේ සිටින අවධියේම ඇසෝෂියේටඩ් ප්‍රෙස් ප්‍රවෘත්ති නියෝජිතායතනයේ වාර්තාකරු ජෙයන් වින්සන්ට් වෙත ඔහුගේ ජංගම දුරකථනය ඔස්සේ කෙටි පණිවුඩයක් ලැබිණි. එහි මාතෘකාව වූයේ 'අවසන් අවවාදය' යන්නයි. පණිවුඩය එවනු ලබන්නා ලෙස සඳහන්ව තිබුණේ මක්කල් පඩෛ (ජනතා හමුදාව) කියා ය. මෙම 'මක්කල් පඩෛ' හමුදාව බොහෝ එල්.ටී.ටී.ඊ. ප්‍රහාර වල වගකීම භාරගත් එකකි. පණිවුඩයෙන් කියැවුණේ ජෙයන් වින්සන්ට් ඕනෑම මොහොතක ඝාතනය වීමට ඉඩ ඇති බවය. පැය කිහිපයක් ගතවූ කල පණිවුඩය එවූ තැනැත්තා වින්සන්ට් වෙත දුරකථනයෙන් කථා කළේය. මාධ්‍යවේදියා සේවය කළ ආයතනය වහාම මැදිහත්ව පසුවදාම ඔහුට යාපනයේ සිට කොළඹට පැමිණීම සඳහා හමුදා අවසරය ලබා දුන්නේය. ''මේ තර්ජනය පිටුපස සිටින්නේ කවුරුන්දැයි මා දන්නේ නෑ. හමුදාවේ කටයුතු පිළිබඳවත් මානවවාදී තත්ත්වය පිළිබඳවත් මගේ වාර්තා සම්බන්ධයෙන් පාර්ශ්වයන් කිසිවක් සතුටු වන්නේ නැහැ. ඒ නිසා මේ පිටුපස සිටින අය කවුරුන් හෝ විය හැකියි'' ඔහු දූත මණ්ඩලයට කීවේය.

## ප්‍රචාරක යුද්ධයක්

ශ්‍රී ලංකාවේ පවත්නා සිවිල් යුද්ධය ශ්‍රී ලංකාවේ බොහෝ ජනමාධ්‍ය මගිනුත් විදේශීය මාධ්‍ය මගිනුත් වාර්තා කෙරෙන්නේ අසම්පූර්ණ සහ පක්ෂග්‍රාහී විලාශයකිනි. ප්‍රධාන වශයෙන් මෙලෙස බරපතල ලෙස ප්‍රවෘත්ති හිඟ කමත්, සමහර විටෙක ඉලක්ක ගත වාර්තාකරණයත් නිසා ගැටුමට ලක්ව ඇති ප්‍රදේශවල මාධ්‍යවේදීන්ගේ කාර්ය සාධන තත්ත්වය බෙහෙවින් දුෂ්කර බවට පත්ව තිබේ.

'මම සිතන්නේ ජාතික සහ ජාත්‍යන්තර මාධ්‍ය යුදමය කාලයකදී වඩාත් ධෛර්යය සම්පන්න විය යුතුයි. නමුත් බොහෝවිට මෙහි පැමිණෙන මාධ්‍යවේදීන් ස්වාධීන මූලාශ්‍ර කෙරෙහි උනන්දුවක් දක්වන්නේ නැහැ. ඒ නිසා යුද හමුදාවට මෙහි සිදුවන දේ සඟවා තැබීමේ ඔවුනගේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පහසු වී තිබෙනවා. මාධ්‍ය නිරතුරුව යාපනයට පැමිණ සිවිල් ජනතාව සහ ස්වාධීන පුද්ගලයන් හමුවීම අත්‍යවශ්‍යයි.' මේ අදහස් යාපනයේ අගරදගුරු සෞන්දරනායගම් පියතුමාගේය.

ජාතික සහ ජාත්‍යන්තර වාර්තාකරුවන් ලෙස යාපනයට පැමිණෙන්නේ ඉතාම සුළු පිරිසකි. ජාතික දිනපතා පුවත්පතක යාපනය වාර්තාකරුවකු දූත මණ්ඩලය වෙත ප්‍රකාශ කළේ ''මා සතුව ප්‍රවෘත්තියක් තිබෙන විට මා කරන්නේ එය කෙටි පණිවුඩයක් මගින් මගේ සංස්කාරක වරයාට දැන්වීමයි. ඔවුන් එම ප්‍රවෘත්තිය මගේ නමින් ලියනවා. යාපනයෙන්ම තොරතුරු එක්රැස් කිරීම බෙහෙවින් අවදානම් සහගතයි.'' යනුවෙනි.

මෙලෙස ප්‍රදේශය තුළ මාධ්‍යවේදීන් සහ නිරීක්ෂකයන් නොමැති වීම නිසා යුදවැදී සිටින පාර්ශ්වයන් දෙකටම යුද්ධය පිළිබඳව අතාත්වික සංඛ්‍යා ලේඛන නිකුත් කිරීමේ හැකියාව ලැබී තිබේ. යුද හමුදාව නැගෙනහිර පළාතේ තොප්පිගලින් එල්.ටී.ටී.ඊ. ය පලවා හැරී මෙන් පසුව රජය ප්‍රකාශ කළේ කැරලිකරුවන් 450ක් සහ සොල්දාදුවන් 20ක් මිය ගිය බවය. එල්.ටී.ටී.ඊ.ය ප්‍රකාශ කළේ තම සටන්කාමීන් 60ක් සහ අවම වශයෙන් හමුදා සොල්දාදුවන් 150ක් මිය ගිය බවය.

''යුද්ධය ආරම්භයේ සිට හමුදාව විසින් තමන් මරාදැමූ බව ප්‍රකාශ කළ එල්.ටී.ටී.ඊ. සටන්කාමීන්ගේ සංඛ්‍යාවන් එකතු කළහොත් මුළු රටේම තවත් දෙමළ මිනිසුන් ඉතිරිව සිටීම ඔබට පුදුමයක් වනු ඇතැයි'' විදේශීය මාධ්‍යවේදියකු පැවසුවේය. යාපනයේ සිටින මාධ්‍යවේදියකු ඒ පිළිබඳව තම අදහස ප්‍රකාශ කළේ මෙසේය. ''පාර්ශ්ව දෙකටම බරපතල හානි

සිදුවී තිබුණත් ඒ බව පාර්ශ්ව දෙකම පිළිනොගන්නේ තම තමන්ගේ සිවිල් ආධාරකරුවන් අධෛර්‍ යයමත් කිරීමට නොකැමැති නියායි.’’

තොරතුරු සොයා බැලීමේ දූත මණ්ඩලය ශ්‍රී ලංකා රජය විසින් ඉටුවිය යුතු කරුණු මෙසේ ඉදිරිපත් කරයි.

- සියල්ලටම ඉහළින් ක්‍රියාත්මක වන විශේෂිත කාර්ය සාධක බලකායක් නිර්මාණය කරමින් යාපනයේ ජනමාධ්‍යවේදී ඝාතන පිළිබඳව බරපතල සහ විවෘත පරීක්ෂණ පැවැත්වීම.
- විශේෂයෙන් යුද හමුදාව වෙත සිවිල් ජනතාවගේ ආරක්ෂාව සම්බන්ධයෙන් වූ ජිනීවා සම්මුතියේ ඇතුළත් විධිවිධාන වලට ගරු කිරීම සඳහා පුහුණුවක් ලබා දෙමින් ගැටුම් පවතින ප්‍රදේශවල කටයුතු කරන මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව පිළිබඳව විශේෂ අවධානයක් දැක්වීම.
- මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා වූ එක්සත් ජාතීන්ගේ දූත මණ්ඩලයකට ශ්‍රී ලංකාවට පැමිණීමට ඉඩකඩ ලබාදීම.
- රජයේ අමාත්‍යවරුන් සහ සෙසු අය විසින් මාධ්‍ය සහ මාධ්‍යවේදීන් එල්ල කරගෙන කරනු ලබන අවඥා සහගත ප්‍රකාශ නිකුත් කිරීම නැවැත්වීම විශේෂයෙන් වත්මන් වාතාවරණය තුළදී එවැනි වාචික ප්‍රහාරයන්ට ඉලක්ක වන මාධ්‍යවේදීන්ගේ ජීවිත අනතුරුදායක තත්ත්වයකට පත්වන්නට ඉඩ තිබේ.
- ප්‍රකාශනයේ නිදහස සම්බන්ධයෙන් වූ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල නොවන හදිසි නීති රෙගුලාසි සහ සෙසු නීති සංශෝධනය කිරීම.

  තොරතුරු සොයා බැලීමේ දූත මණ්ඩලය ගැටුමට සම්බන්ධව සිටින සියලුම පාර්ශ්ව වෙත පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරයි.

- සන්නද්ධ ගැටුම් වාර්තාකරණයෙහි සෙදී සිටින මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව පිළිබඳව වූ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයෙහි අංක 1738 වැනි යෝජනාවේ ඇතුළත් විධිවිධාන උල්ලංඝනය වන පරිදි මාධ්‍ය ක්‍රියාකාරිකයන් වෙත එල්ල කෙරෙන සියලුම තර්ජනයන් සහ හිංසනයන් අත්හිටුවීම.
- සංස්කරණ නිදහස සීමා කිරීමේ උත්සාහයන් නැවැත්වීම.